# ලංසු ආරාධනාවයි

## කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## සී/ස ලංකා පොහොර සමාගම

## සී/ස ලංකා පොහොර සමාගමට අයත් ප්‍රාදේශීය පොහොර ගබඩා බදු පදනම මත ලබාදීම සඳහා වූ ලංසු කැඳවීම

## ලංසු අංක : 2024/CFC/RENT/01

සී/ස ලංකා පොහොර සමාගම පොහොර ගබඩා කිරීම සඳහා භාවිතා කරනු ලබන දොඩංගොඩ, වරණ, බිබිල, පොතුවිල්, හිඟුරක්ගොඩ 1, හිඟුරක්ගොඩ 2, සහ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය පොහොර ගබඩා 07ක් බදු පදනම මත ලබාදීම සඳහා සී/ස ලංකා පොහොර සමාගම වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

02. සී/ස ලංකා පොහොර සමාගම බදු පදනම මත ලබා දෙන්නා වූ ප්‍රාදේශීය පොහොර ගබඩා පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රාදේශීය පොහොර ගබඩාව | ලිපිනය | දිග (අඩි) | පළල (අඩි) | වර්ග අඩි ප්‍රමාණය | උස (අඩි) | ධාරිතාවය (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|---|
| 1 | දොඩංගොඩ | ප්‍රාදේශීය පොහොර ගබඩාව, සපුගහවත්ත, දොඩංගොඩ. | 75 | 42 | 3150 | 25 | 350 |
| 2 | වරණ | ප්‍රාදේශීය පොහොර ගබඩාව, කොඩිගාමන්, පාරු තිරල් පාර,රෝහල අසල, වරණ. | 123 | 41 | 5043 | 25 | 800 |
| 3 | බිබිල | ප්‍රාදේශීය පොහොර ගබඩාව, බිබිල. | 100 | 40 | 4000 | 20 | 750 |
| 4 | පොතුවිල් | ප්‍රාදේශීය පොහොර ගබඩාව, පොතුවිල්. | 132 | 45 | 5940 | 25 | 800 |
| 5 | හිඟුරක්ගොඩ 1 | ප්‍රාදේශීය පොහොර ගබඩාව, සමූපකාර මාවත, හිඟුරක්ගොඩ 1. | 114 | 41 | 4674 | 20 | 800 |
| 6 | හිඟුරක්ගොඩ 2 | ප්‍රාදේශීය පොහොර ගබඩාව, සමූපකාර මාවත, හිඟුරක්ගොඩ 2. | 134 | 49 | 6566 | 15 | 1000 |
| 7 | ත්‍රිකුණාමලය | ප්‍රාදේශීය පොහොර ගබඩාව, ලව්ලේන්, ත්‍රිකුණාමලය. | 110 | 27 | 2970 | 15 | 500 |

03. ඉහත ප්‍රාදේශීය ගබඩා වල පහත සඳහන් පහසුකම් ඇත.

- පහසුවෙන් ලගාවිය හැකි ප්‍රධාන මාර්ග අවට පිහිටා තිබීම.
- ජල විදුලිය පහසුකම් සහිත වීම.
- වාහන නතර කිරීමේ පහසුකම් සහිත වීම.
- කාර්යාල කාමර පහසුකම් සහිත වීම.
- ආරක්ෂක වැටවල් සහ ගේට්ටු සහිත වීම.

**04.** මෙම ගබඩා වසර 3ක කාලයක් සඳහා බදු දෙන අතර තවත් වසර 5ක කාලයක් ආයතනයේ අභිමතය පරිදි දීර්ඝ කරන අතර උපරිම වසර 8ක කාලයකි. බදු කුළිය පළමු වසර 3න් පසුව වසරින් වසර 25% බැගින් වැඩි වේ.

**05.** ලංසුකරු විසින් ලීත් මාසයක් සඳහා ගෙවන මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

**06.** මෙම ලංසුවට අදාල සිංහල භාෂාවෙන් මුද්‍රිත ලංසු කැඳවීමේ ලේඛණය ආපසු නොගෙවනු ලබන රු. 1,000/= ක මුදලක් වත්තල, හුණුපිටිය පිහිටි සී/ස ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ මුදල් භාරකරුට මුදලින් ගෙවීමෙන් 2024.04.22 දින පෙ.ව. 9.00 සිට 2024.05.14 දින ප.ව.3.30 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි දී ලබා ගත හැකිය.

**07.** ලංසු පත්‍රිකාව පිටපත් දෙකකින් යුතුව, "මුල් පිටපත (Original)" හා "අනු පිටපත (Duplicate)"යනුවෙන් මුල් පිටුවේ සඳහන් කර, පිටපත් දෙකම වෙන වෙනම කවර තුළ බහා මුද්‍රා තබා නැවත එක් කවරයක බහා මුද්‍රාතබා "ලංසු අංක: 2024/CFC/RENT/01" යනුවෙන් ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් 2024.05.15 දින ප.ව. 2.30 ට පෙර ලැබෙන සේ,

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ප්‍රසම්පාදන අංශය,
සී/ස ලංකා පොහොර සමාගම,
ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල.

යන ලිපිනයට එවිය යුතුය. නැතහොත්, ඉහත කී ලිපිනයේ ප්‍රසම්පාදන අංශයෙහි ඒ සඳහා තබා ඇති ලංසු පෙට්ටියේ බහාලිය යුතුය.

**08.** 2024.05.15 දින ප.ව.2.30 ට මෙම ලංසුව වසා දමනු ලබන නමුත්, මෙම ගබඩා කුලියට දීම සඳහා සුදුසු ලංසුකරුවෙකු තෝරා ගන්නා තෙක්ම ලංසුව සඳහා ලංසුපත් ඉදිරිපත් කල හැකිය.

**09.** පූර්ව ලංසු රැස්වීම 2024.05.07 වන දින පෙ.ව.11.00 ට හුණුපිටිය, වත්තල පිහිටි සී/ස ලංකා පොහොර සමාගමේ ප්‍රසම්පාදන අංශයේ පැවැත්වේ. ඒ සඳහා සහභාගී වීමට සියළුම ලංසුකරුවන් වෙත ආරාධනා කරනු ලබයි.

**10.** මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අවශ්‍ය විස්තර ස්ථානීය පරීක්ෂාවක් සිදු කර හෝ සී/ස ලංකා පොහොර සමාගමේ කළමනාකරු (බෙදාහැරීම්) වෙතින් ලබා ගෙන ඉල්ලුම් කල හැකිය. (දූරකථන අංකය: 011-2930381 / 077-3435408).

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
සී/ස ලංකා පොහොර සමාගම,
ප්‍රසම්පාදන අංශය,
ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල.
2024.04.22 වන දින